**පළාත් භාණ්ඩාගාරය,**

**උතුරු මැද පළාත.**

**වත්කම් කළමනාකරණය සඳහා පරිගණක මෘදුකාංගයන් වැඩිදියුණු කර සැපයීම**

**ටෙන්ඩරයේ විෂය පථය හා අවශ්‍යතාවයන් දැක්වෙන පත්‍රිකාව**

## 01. හැඳින්වීම

උතුරු මැද පළාත් සභාව 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටවනු ලැබූ රාජ්‍ය ආයතනය වන අතර පළාත් සභාවේ මූල්‍ය කටයුතු අධීක්ෂණය, මෙහෙයවීම හා ප්‍රගති සමාලෝචනය පළාත් භාණ්ඩාගාරයේ ප්‍රධාන මෙහෙවරකි. මෙම මෙහෙවර නිසි පරිදි ඉටුකිරීම සඳහා පළාත් සභාවේ වත්කම් කළමනාකරණය පිණිස පරිගණක මෘදුකාංගයක් වැඩිදියුණු කර පළාත් සභාව යටතේ ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ප්‍රාදේශීය සභා සහ වෙනත් ගිණුම් ඒකක වලට හඳුන්වා දී මනා වත්කම් කළමනාකරණයක් පවත්වා ගැනීමට බලාපොරොත්තු වේ. ඒ අනුව පාවිච්චි කරන්නාට පහසුවෙන් පරිහරණය කළ හැකි සහ අනතුරුව සේවා යෝජකයාට අනාගත වෙනස්වීම් වලට අනුව කාලීනව වැඩිදියුණු කළ හැකි පරිගණක මෘදුකාංගයක් වැඩිදියුණු කර ස්ථාපිත කිරීම මෙම ටෙන්ඩරයෙන් අපේක්ෂා කෙරේ.

## 02. විෂය පථය:-

උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ප්‍රාදේශිය සභා සහ වෙනත් උප ගිණුම් ඒකක මගින් මිළදී ගනු ලබන හා වෙනත් ආකාරයෙන් ලැබෙන ඉඩම්, ගොඩනැගිලි, වාහන, කාර්යාල උපකරණ, ව්‍යුහයන් සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගිණුම් ගත කිරීමත්, එකී අයිතමයන් බැහැර කිරීම්, වෙනත් දෙපාර්තමේන්තු වලට නිකුත් කිරීම් ගිණුම් ගත කිරීමත්, නිරන්තර පාවිච්චි නොවන සහ විවිධ හේතූන් මත බැහැර කළ යුතු අයිතම පහසුවෙන් හඳුනා ගැනීමටත්, යලි ඇණවුම් කළ යුතු තොග මට්ටම් තිරණය කිරීමටත්, හැකි වන පරිදි පරිගණක මෘදුකාංගයක් වැඩිදියුණු කිරීම ටෙන්ඩර් කරුවන්ගෙන් අපේක්ෂා කෙරේ.

## 03. පිලිවිතර සහ ප්‍රමිතයන්

වැඩිදියුණු කර ස්ථාපිත කිරීමට යෝජිත පරිගණක මෘදුකාංගය පහත සඳහන් ගුණාංග වලින් යුක්ත විය යුතුය.

1. වැඩිදියුණු කරන මෘදුකාංගය Windows XP සහ Windows Vista යන මෙහෙයුම් පද්ධති වලට ගැළපෙන පරිදි සකස් විය යුතුය.

2. වත්කම් කළමනාකරණය සඳහා පළාත් සභා මුදල් රෙගුලාසි සහ වරින් වර පනවන ලද වෙනත් චක්‍රලේඛ වලින් හඳුන්වා දී ඇති පොත් පත් හා ලේඛන, වැඩිදියුණු කිරීමට යෝජිත පරිගණක මෘදුකාංගය මගින් නඩත්තු කළ හැකි විය යුතුය. එබැවින් තෝරා ගන්නා ලද සැපයුම් කරු වත්කම් පාලනය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධිවිධාන පිළිබඳව නිසි අවබෝධයක් ලබාගැනීම අවශ්‍ය වේ.

3. අවශ්‍ය ඕනෑම වේලාවක තොග මට්ටම්, තොග ශේෂයන්, පළුදු වූ අයිතමයන්, සංචලනය නොවන අයිතමයන්, සෙමෙන් සංචලනය වන අයිතමයන් යනාදිය හදුනාගත හැකි විය යුතුය.
4. පළාත් සභාව විසින් දැනට හඳුන්වා දී ඇති භාණ්ඩ සංකේත අංක ඒ ආකාරයෙන්ම මෘදුකාංගය තුළ ස්ථාපනය විය යුතු අතර එම සංකේත අංක යටතේ උප සංකේත පාවිච්චි කරන්නාගේ අවශ්‍යතාවය පරිදි සකස් කර ගැනීමට පහසුකම තිබිය යුතුය. එක් එක් ස්ථාවර වත්කම යටතේ පරිගණක ගත කළ යුතු අවම දත්ත අවශ්‍යතාවයන් හා ස්ථාවර වත්කම් වල උප ප්‍රභවයන් පිළිබඳ විස්තරයක් උපලේඛණ අංක 01 (Appendex 01) වශයෙන් මීට යාකර ඇති අතර, ඉදිරියේදි ඇතිවන අවශ්‍යතාවය පරිදි අතිරේක සංකේත හා අයිතම නාම ඇතුලත් කරගැනීමේ පහසුකම සේවා යෝජකයාට ලබාදිය යුතුය.
5. ඉඩම් සහ ගොඩනැගිලි , යන්ත්‍ර සූත්‍ර, වාහන සහ කාර්යාල උපකරණ අත්පත් කරගැනීමේ පිරිවැය යටතේ මිල කළ යුතුය. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වල තොග ගණනය කිරීමේදි සහ මිල කිරීමේදි පළමුව ලැබීම් පළමුව නිකුත් කිරීම් (First in First out) පදනම යටතේ මිල කල යුතුය.
6. එක් එක් ස්ථාවර වත්කම යටතේ අපේක්ෂිත ක්ෂය කිරීම් පිළිබඳ විස්තරයක් පහත දැක්වෙන අතර එය ස්වයංක්‍රියව ගණනය කිරීමේ පහසුකම වැඩසටහනට ඇතුළත් විය යුතුය.

| | | |
|---|---|---|
| i. | ඉඩම් | නැත. |
| ii. | ගොඩනැගිලි | 2.5% |
| iii. | ව්‍යුහයන් | 5% |
| iv. | යන්ත්‍ර සහ පිරියත | 10% |
| v. | වාහන | 20% |
| vi. | කාර්යාල උපකරණ | 20% |

7. භාණ්ඩ ලැබීම්, නිකුත් කිරීම් සහ ශේෂයන් පිළිබඳ දත්ත ඕනෑම වේලාවක බලාගත හැකිවිය යුතු අතර, පහත සඳහන් එක් එක් වත්කම් වර්ගීකරණය යටතේ වාර්තා ලබා ගැනීමට හැකි විය යුතුය.
   i. ඉඩම් සහ ගොඩනැගිලි
   ii. වාහන
   iii. කාර්යාල උපකරණ
   iv. ව්‍යුහයන්
   v. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

8. ලබා ගැනීමට අපේක්ෂා කරන වාර්තා පිළිබඳ ආකෘතීන් ඇමුණුම් 02 සිට ඇමුණුම් 23 දක්වා මීට යාකර ඇති අතර, ඉතා පහසුවෙන් එම වාර්තා මුද්‍රණය කරගැනීමට හැකි විය යුතුය.
9. වත්කම් නඩත්තු කිරීම් පිළිබඳ විස්තර එනම් වත්කම් වර්ගය, මිළදී ගත් දිනය, නඩත්තු වියදම ආදී විස්තර පරිගණක ගත කිරීමට හැකිවිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවලදි වත්කම් නඩත්තු කිරීම් පිළිබඳ විස්තර ලබාගත හැකි විය යුතුය.
10. වැඩිදියුණු කරන ලද පරිගණක මෘදුකාංගය ජාලගත කිරීමේ පහසුකම තිබිය යුතු අතර, පරිගණක මෘදුකාංගයට ප්‍රවේශ වීම දත්ත ඇතුළත් කිරීම සහ දත්ත වෙනස් කිරීම සඳහා එක් එක් අදියර යටතේ ප්‍රවේශ වීමේ බලය එක් එක් නිලධාරියෙකුට ලබාදීමේ පහසුකම

වැඩසටහනට ඇතුළත් විය යුතුය. එක් එක් අදියර යටතේ ලබාදිය යුතු ප්‍රවේශවීමේ බල මට්ටම් පරිගණක මෘදුකාංගය වැඩිදියුණු කරන අවස්ථාවේදි ලබාදෙනු ලැබේ.

11. එක් එක් ගිණුම් ඒකක මගින් නඩත්තු කරන ලද වත්කම් වර්ග හා ශේෂයන් එක් එක් වත්කම් වර්ගීකරණය යටතේ අදාළ දෙපාර්තමේන්තු මට්ටමින්, අදාළ අමාත්‍යාංශ මට්ටමින් සහ පළාත් භාණ්ඩාගාරයේදී පළාත් මට්ටමින් ඒකාබද්ධ කිරීමේ පහසුකම තිබිය යුතුය. උදාහරණයක් වශයෙන් කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් නඩත්තු කරනු ලබන වත්කම් දත්ත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ඒකාබද්ධ කර දෙපාර්තමේන්තු මට්ටමින්ද ප්‍රධාන අමාත්‍යාංශයේදී එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වල වත්කම් ඒකාබද්ධ කර අමාත්‍යාංශය සතුව ඇති මුළු වත්කම්ද, පළාත් භාණ්ඩාගාර මට්ටමේදි සියළුම අමාත්‍යාංශ වල දත්ත ඒකාබද්ධ කර පළාතේ මුළු වත්කම් ප්‍රමාණය ගණනය කිරීමට හැකි වන පරිදි පහසුකම තිබිය යුතුය.

12. මෙම පරිගණක මෘදුකාංගයේ භාෂා මාධ්‍යය සිංහල භාෂාව විය යුතුය. ඒ සඳහා භාවිතා කරන භාෂා අක්ෂර යුනිකෝඩ් (Unicode) අක්ෂර විය යුතුය.

**04. වෙනත් කොන්දේසි**

1. වැඩිදියුණු කරන ලද පරිගණක මෘදුකාංගයේ අයිතිය පළාත් භාණ්ඩාගාරය සතු විය යුතු අතර වරින් වර චක්‍රලේඛ මගින් කරන වෙනස්වීම් එම වැඩසටහනට ඇතුළත් කිරීමට හැකිවන පරිදි ප්‍රභව කේත (Source Code) සේවා යෝජකයාට ලබාදීමට ටෙන්ඩර් කරුවන් එකඟ විය යුතුය.
2. වගකීම් කාලය වර්ෂ 02 ක් විය යුතුය. මෙම කාලය තුළ පරිගණක මෘදුකාංගයේ අඩුපාඩු සහ දෝෂයන් නිවැරදි කර දීමට සැපයුම් කරු කටයුතු කළ යුතුය.
3. ගිවිසුමට එළඹෙන අවස්ථාවේදි මෙම කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කරන බවට සැපයුම් කරු ඉදිරිපත් කරනු ලබන 10% ක කාර්ය සාධන ඇපකරයෙන් 5% ක් අදාළ මෘදුකාංගය ස්ථාපිත කර මාස 03 කට පසු නිදහස් කරනු ලබන අතර, ඉතිරි 5% නිදහස් කරනු ලබන්නේ මුළු වගකීම් කාලය වූ වර්ෂ 02 අවසන් වීමෙන් පසු පරිගණක මෘදුකාංගය සතුටුදායක ලෙස ක්‍රියාත්මක වන බව සැහීමට පත්වීමෙන් පසුවය.
4. යම් දෝෂයක් දැනුම් දීමෙන් පසු දින 03 ක කාලයක් තුළ සැපයුම් කරු ඒ සඳහා මැදිහත් විය යුතු අතර අනතුරුව සතියක කාලයක් ඇතුළත අදාළ නිවැරදි කිරීම් කළ යුතුවේ.
5. පරිගණක මෘදුකාංගය ස්ථාපිත කිරීමෙන් පසු එක් ගිණුම් ඒකකයකින් අවම වශයෙන් නිලධාරීන් 02 කු වත් පුහුණු කළ යුතුවේ. ඒ සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් ආහාර හා ශාලා පහසුකම් ලබාදිය හැකි අතර, දේශන ගාස්තු සැපයුම් කරු විසින් දැරිය යුතුවේ.

ඉහත කොන්දේසි වලට එකඟව ටෙන්ඩරය ඉදිරිපත් කරමි.

දිනය:-.......................................          ...........................................

ටෙන්ඩර්කරුගේ අත්සන හා නම